සියලුම හිමිකම් ඇවිරිණි
[illegible]
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 7 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

නම/විභාග අංකය :- ................................................................ කාලය: පැය 02යි.

### I පත්‍රය

- අංක 01 - 20 තෙක් ප්‍රශ්නවල වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) බුදුරජාණන් වහන්සේ සතියක් ඇසිපිය නොහෙළා බලා සිටිමින් බෝධීන් වහන්සේට උපකාර දැක්වූයේ,
(1) පළමු සතියේ ය. (2) දෙවන සතියේ ය. (3) තුන්වන සතියේ ය.

(02) බුදු සසුනේ පළමු ද්වෛවාචික උපාසකවරුන් ලෙස හැඳින් වෙන්නේ,
(1) වප්ප භද්දිය දෙදෙනාය
(2) උපතිස්ස කෝලිත දෙදෙනාය
(3) තපස්සු භල්ලුක දෙදෙනාය

(03) ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස බුදුරජාණන් වහන්සේට ආරාධනා කළේ,
(1) සහම්පති මහා බ්‍රහ්මයා
(2) ඝටිකාර මහා බ්‍රහ්මයා
(3) මහා බ්‍රහ්මයා

(04) බුදුරජාණන් වහන්සේ ලක්වාසීන්ගේ යහපත පිණිස පළමුවෙන්ම ලංකාද්වීපයේ මහියංගනයට වැඩම කළේ,
(1) වෙසක් පුන් පොහොය දිනය
(2) උඳුවප් පුන් පොහොය දිනය
(3) දුරුතු පුන් පොහොය දිනය

(05) බුද්ධ ශාසනයේ ප්‍රථමයෙන්ම සෝවාන් වූ රජතුමා,
(1) සුද්ධෝදන රජතුමා
(2) බිම්බිසාර රජතුමා
(3) කොසොල් රජතුමා

(06) වේළුවනාරාම පූජාවෙන් පසුව බිම්බිසාර රජතුමාගෙන් පින් බලාපොරොත්තු වූ ඥාති ප්‍රේත පිරිස නිමිතිකොට පින් අනුමෝදන් කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,
(1) තිරොකුඩ්ඩ සූත්‍රයයි
(2) ආදිත්ත පරියාය සූත්‍රයයි
(3) අනත්ත ලක්ඛණ සූත්‍රයයි

(07) "රජසත් පව් නොකොට" ........ යන කවියෙහි ඇතුළත් බුදු ගුණය,
(1) සුගත ගුණය (2) ලෝකවිදූ ගුණය (3) අරහං ගුණය

(08) පාලි ත්‍රිපිටකය තුළ සූත්‍ර දේශනා දහස් ගණනක් පවතී. බෞද්ධයන් වැඩිපුරම භාවිතයට ගන්නා සූත්‍ර දේශනා අතර තුන් සූත්‍රයට ඇතුළත් වන්නේ,
(1) මහා මංගල, රතන, කරණීය මෙත්ත සූත්‍රයන් ය.
(2) මහා මංගල, කරණීය මෙත්ත, සිගාලෝවාද සූත්‍රයන් ය.
(3) රතන, මංගල, අනත්ත ලක්ඛණ සූත්‍රයන් ය.

(09) සිඟාලෝවාද සූත්‍රයට අනුව ශිෂ්‍යයා විසින් ගුරුවරයාට ඉටුකළ යුතු යුතුකමක් නොවන්නේ,
(1) හොඳින් ඉගෙනීම
(2) මැනවින් හිස්මවීම
(3) සියලු ඇප උපස්ථාන සිදු කිරීම

(10) වර්තමාන සමාජයේ දහමට හිතියට පටහැනි ක්‍රියා සිදුවන්නේ,
(1) උත්පාත වත්ත නිසාය
(2) වෛරය අඩු නිසාය
(3) ඉවසීම නැති නිසාය

(11) බුදු සසුනේ ධර්ම සේනාධිපති නමින් ප්‍රකට වූයේ,
(1) මුගලන් මහරහතන් වහන්සේය
(2) සැරියුත් මහරහතන් වහන්සේය
(3) සීවලී මහරහතන් වහන්සේය

(12) අන්ධ දෙමාපියන්ට හොඳින් සැලකූ පුතෙකුගේ තොරතුරු ඇතුළත් ජාතක කතාව වනුයේ,
(1) තිත්තිර ජාතකයයි
(2) සාලිකේදාර ජාතකයයි
(3) සාම ජාතකයයි

(13) කුඹුරෙන් ලබාගත් වී අස්වැන්නෙන් පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම දහමෙහි හඳුන්වා ඇත්තේ,
(1) අග්‍ර ශස්‍ය දානය නමින්ය
(2) සාංඝික දානය නමින්ය
(3) ධර්ම දානය නමින්ය

(14) බුදුරජාණන් වහන්සේ දේශනා කළ අත්තූපනායික ධර්මය ඇතුළත් සූත්‍රය හැඳින්වෙන්නේ,
(1) දම්සක් පැවතුම් සූත්‍රය නමිනි
(2) පත්ත කම්ම සූත්‍රය නමිනි
(3) වේළුද්වාර සූත්‍රය නමින්ය

(15) දහමෙහි අධිපති ධර්ම තුනකි. එයින් තමා මුල්කරගෙන පින සදාචාරයෙහි පිහිටුවීම, හඳුන්වන්නේ,
(1) අත්තාධිපති නමිනි (2) ධම්මාධිපති නමිනි (3) ලෝකාධිපති නමිනි

(16) අය වැය සමබරව පවත්වාගෙන යන පුද්ගලයන් ආර්ථිකව නිවැරදිව කළමනාකරණය කර ගනී. එවැනි පුද්ගලයින් දහමෙහි සඳහන්කරන්නේ,
(1) උදුම්බර ඛාදික ලෙසය
(2) තුලාධාරික ලෙසය
(3) අජද්ධුමාරික ලෙසය

(17) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් දොළොස් පින් කිරියවත් පිළිබඳ පැහැදිලි කර ඇත්තේ,
(1) බුදුගුණ අලංකාරයේ ය
(2) කාව්‍යශේඛරයේ ය
(3) සැළලිහිණි සංදේශයේ ය

(18) බුදු සසුනේ අග්‍ර දායකයා හා අග්‍ර දායිකාව නම්,
(1) අනේපිඬුසිටුතුමා හා විශාඛා සිටු දේවිය යි.
(2) ධම්මික සිටුතුමා හා විශාඛා සිටු දේවිය යි.
(3) අනේපිඬු සිටුතුමා හා සුජාතා සිටු දේවිය යි.

(19) කරණීය මෙත්ත සූත්‍රයට අනුව මෙත් වඩන්නකු තුළ තිබිය යුතු උසස් ගුණාංග,
(1) දහයකි (2) දොළහකි (3) පහළොවකි

(20) තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා වශයෙන් පත්වූයේ,
(1) බරණැස් සිටුතුමා (2) අනේපිඬු සිටුතුමා (3) යසකුල පුත්‍රයා

## II පත්‍රය

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. 02 සිට 06 දක්වා ප්‍රශ්න වල (i) කොටසට ලකුණු 02 ද (ii) කොටසට ලකුණු 03 ද (iii) කොටසට ලකුණු 05 ද හිමිවේ. 7 ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 05කි.

(01) පාසලේ බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරුතුමිය හත ශ්‍රේණියේ දරුවන්ට පංච සීලය හා ආජීව අෂ්ටමක සීලය පිළිබඳ කරුණු පැහැදිලි කළාය. ඒ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ගිහියන් වන අපගේ නිත්‍ය සීලය වන පංච සීලයට අයත් ශික්ෂාපද අතරින් දෙකක් ලියන්න.
(ii) අකුසලයෙන් වෙන්වීම හා කුසලයෙහි නිරතවීම සඳහා දහමේ යෙදී ඇති වචන දෙක ලියන්න.
(iii) ආජීව අෂ්ටමක සීලයෙහි වචනයේ සංවරය සඳහා ඇති ශික්ෂාපද හතරෙන් දෙකක් ලියන්න.
(iv) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීලයට අයත් මාර්ගාංග තුන ලියන්න.
(v) සීලය ආරක්ෂා කිරීමෙන් සමාජයට සිදුවන යහපත පිළිබඳ වාක්‍ය හතරක් ලියන්න.

(02) (i) අප විසින් අනුගමනය කළයුතු සිරිත් විරිත් සඳහන් වන කාව්‍ය ග්‍රන්ථ දෙකක් ලියන්න.
(ii) ඔබ පාසලේදී අනුගමනය කරන යහපත් සිරිත් තුනක් ලියන්න.
(iii) ඔබ පන්සලට ගිය විට භික්ෂූන් වහන්සේලා සමග කථාබහ කිරීමේදී පහත සඳහන් වචන සඳහා භාවිතා වන ශාසනික වචන ලියන්න.

පිරිනවා -
අනුගානවා -
අනුගව කරනවා -
නිදනවා -
ජලස්නානය කරනවා -

(03) (i) මෙලොව ජීවත් වන කාලය තුළ අපට මුහුණ දීමට සිදුවන අටලෝ දහම නම් කරන්න.
(ii) සියලු කර්මය නිසාම සිදු නොවන බව පෙන්වා දෙන නියාම ධර්ම පහෙන් තුනක් ලියන්න.
(iii) බුදුරජාණන් වහන්සේ රෝග හටගන්නා ක්‍රම අටක් පිළිබඳ ගිරිමානන්ද සූත්‍රයේදී පැහැදිලි කර ඇත. ඉන් පහක් සඳහන් කරන්න.

(04) (i) චතුරාර්ය සත්‍ය පිළිබඳව පැහැදිලි කර ඇති සූත්‍රය නම් කරන්න.
(ii) ආර්ය සත්‍යය හතර නිවැරදිව පිළිවෙළින් ලියන්න.
(iii) චතුරාර්ය සත්‍ය පිළිබඳ ඉගෙනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන ලියන්න.

(05) (i) අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ ලංකාගමනය සිදුවූයේ කිනම් පොහෝ දිනකද?
(ii) උන්වහන්සේ සමග වැඩම කළ ධර්ම දූත පිරිස නම් කරන්න.
(iii) අපගේ අතීත උරුමයන් ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පහක් ලියන්න.

(06) (i) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් ශිෂ්‍යයාගෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම් වලින් දෙකක් ලියන්න.
(ii) එයින් එක් කරුණක් කෙටියෙන් පහදන්න.
(iii) ගුරුතුමාගේ සිත නොරිදවා ඔබගේ ඉගෙනීමේ කටයුතු සිදු කිරීමට ඔබ ගන්නා ක්‍රියා මාර්ග මොනවා ද?

(07) කොටස් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

| | |
|---|---|
| (i) නව අරහාදි බුදුගුණ | (ii) නියාම ධර්ම |
| (iii) අභිධර්ම | (iv) බුදුසසුනේ අග්‍රෝපාසකයා |